ශ්‍රී ලංකාවේ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව ඉදිරිපිටදී ය.

## කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව එරෙහිව ඊ. ඒ. එන්. ඩී. එදිරිසිංහ

*RTIC Appeal /09/2017* (කොමිෂන් සභා රැස්වීමේ කොටසක් ලෙස 2017.06.27 පවත්වන ලදී)

සභාපති - මහින්ද ගම්මන්පිල

කොමිෂන් සභා සාමාජිකයින් - ජ්‍යෙෂ්ඨ නීතීඥ කිශාලි පින්ටෝ -ජයවර්ධන

- ජ්‍යෙෂ්ඨ නීතීඥ එස්.ජී. පුංචිහේවා

- විනිසුරු ඒ.ඩබ්.ඒ. සලාම්

- ආචාර්ය සෙල්වි තිරුචන්ද්‍රන්

අභියාචක : ඊ. ඒ. එන්. ඩී. එදිරිසිංහ මහතා විදුහල්පති කාර්මික විද්‍යාලය මාතලේ

නොතීසි ලද පාර්ශවය : අධ්‍යක්ෂ ජෙනරාල්, කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව (ඩීටීඊටී)

පෙනී සිටීම : එස් අමුණුගම නියෝජ්‍ය අධ්‍යක්ෂ ඩී. ටී. ඊ. ටී. සහ ප්‍රධාන ලිපිකරු වයි. ජී. සී. ගමගේ (ඩීටීඊටී)

මෙම අවස්ථාවෙහිදී පෞද්ගලික හේතූන් මත තමාට පැමිණීමට නොහැකි බව දක්වමින් නියෝජිතවරියන් විසින් ගෙන එන ලද ලිපියේ දක්වා ඇති පෞද්ගලික හේතූන් කොමිෂන් සභාව විසින් පිළිගැනීමෙන් පසුව කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජෙනරාල් සහ නම් කළ නිලධාරී ජේ. ඒ. රන්ජිත් මහතා වෙනුවෙන් එස්.අමුණුගම මෙනෙවියට ද (මානව සම්පත් කළමනාකරණ සහාය අධ්‍යක්ෂිකා) වයි.ජී.සී. ගමගේ (ප්‍රධාන ලිපිකරු)ඩී.ටී.ඊ.ටී. ද මහත්මියටද පෙනී සිටීමට අවසර ලදී.

අභියාචනාකරු විසින් ඉදිරිපත් කර තිබූ තොරතුරු ඉල්ලීම ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවයේ I පන්තියේ නිලධාරී පුරප්පාඩු පිරවීමට අදාළ වේ. විශේෂයෙන්ම 2012.09.12 දාතමින් යුතුව, අංක 1360 රජයේ ගැසට් පත්‍රයේ අයදුම්පත් කැඳවා අභියාචක ඇතුළු ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවයේ II පන්තියේ නිලධාරීන් 18 දෙනෙකු I පන්තියට උසස් කිරීමට අදාල ඩී.ජී. අංක DTET/04/05/SLTES/2011 දරණ ලිපියේ පිටපතක් සහ ඉහත උසස් කිරීමට අදාළ තොරතුරු සමග රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අධ්‍යක්ෂ ජනරාල් වෙත ඒවා ඇති අංක PSC/App/07/72/2011 සහ 2013.07.30 දිනැති ලිපියෙහි පිටපතක් ද, ඉහත කී තැනැත්තන් 18 දෙනාට පත්වීම් 18 ලබා දීමට අදාළ කුසලතා ලැයිස්තුගත කළ ලේඛනයේ පිටපතක් ද විශේෂයෙන් ඉල්ලා සිටියි. අයුතු ලෙස පුද්ගලිකත්වය ආක්‍රමණය කිරීමේ අවදානම යන 5 (1) (අ) වගන්තියේ පදනම යටතේ තොරතුරු නිලධාරියා විසින් අභියාචකගේ තොරතුරු ඉල්ලීම ප්‍රතික්ෂේප කරන ලදී. නම් කළ නිලධාරියාට ඉදිරිපත් කළ අභියාචනය සම්බන්ධයෙන් මාසයක් ඉක්මවා ගියද ප්‍රතිචාරයක් නොලැබිණි.

ශ්‍රී ලංකාවේ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව ඉදිරිපිටදී ය.

අභියාචන විභාගයේදී අභියාචක ප්‍රකාශ කර සිටියේ තමන් මේ වන විට, 2012.09.12 දිනැති අංක DTET/04/05/SLTES/2011 දරණ ලිපිය සහ ඉහත සඳහන් පුද්ගලයින් 18 දෙනා පත්කිරීමට අදාළ නිපුණතා ලැයිස්තුව අඩංගු ලිපිය ද වෙනත් මාර්ගවලින් ලබාගැනීමට සමත් වූ බව ය. 2013.07.30 දිනැති අංක PSC/App/07/72/2011ලිපියට අදාළව අධ්‍යක්ෂ ජනරාල් ඩී.ටී.ඊ.ටී. නියෝජනය කරන නිලධාරිනියන් ප්‍රකාශ කොට සිටියේ මුල් අවස්ථාවේදී ලිපිය ලබා නුදුන්නේ එසේ කිරීමට ඔවුන්ට බලයක් ඇති බව ඔවුන් හට නිසැක නොවූ නිසා බවයි. මන්ද එය රාජ්‍ය සේවා කොමිසම විසින් එවන ලද්දක් බැවින් හා තෙවන පාර්ශවයේ පෞද්ගලිකත්වයට බලපෑ හැකි තොරතුරු අඩංගු වන බැවින් නිසා බවයි.

මෙම කාරණය සලකා බලමින් කොමිෂන් සභාව සඳහන් කළේ පනතේ 3 (1) වගන්තියේ සඳහන් වන පරිදි, ඉල්ලා සිටින තොරතුරු පොදු අධිකාරියක් සන්තක වන විට එම තොරතුරු ලබා දීමට එම පොදු අධිකාරිය බැඳී සිටින බවයි. තවද පනතේ 41 (2) වගන්තිය යටතේ 03.02.2017 දිනැති ගැසට් අංක 2004/66 හි අඩංගු අමාත්‍යවරයා විසින් පනවන ලද 12 වන රෙගුලාසියට අනුව ඉල්ලා ඇති තොරතුරු පැහැදිලිවම වෙන් කොට හඳුනාගත හැකි බවයි. එම නිසා ඉල්ලා ඇති තොරතුරු, තෙවන පාර්ශවයන්ට බලපාන තොරතුරු වලින් වෙන්කොට සපයන ලෙසට කොමිෂන් සභාව නියෝග කරන ලදී.

අභියාචන විභාගයේ වැඩ කටයුතු මේ අනුව අවසන් කරන ලදී.